


### ගම ද වාස ගම ද ඇහැලියගොඩ වූ

# ගීත රචනා කලාවේ බණ්ඩාර දෙයියෝ

කඩිමුඩියේ කොළොම්තොට දිසාවට යාත්‍රා කරමි. පුංචි වැස්සක් තිබ්බත් ඇහැලිය ගොඩ නගරය පසු කරද්දී සවස 2 පසුවූ බව ප්‍රේමදාස උන්නැහේ හිටවපු ඔරලෝසු කණුව බිමට නැමිලා කිවුවා. පතල් වල මැණික් වලට සුන්දර වටිනාකම් තිබුනත් එහි ජීවිත කටුක බවත් සමන් දෙවු අඩවියේ කදු වැටි, බඩ වැටි, ලා දිය දහරාවන් ද ලේ උරා බොන පුහුඩාවන්ගෙන් ගහන ඉසව් පසුකර පාගලා යමි. සවස 3.30 ට මනෝ අංකල්ගේ "හඩ නිහඩ" බලන්න පෙරුම්පුරා ගෙන හනිකට යමි. අද රාත්‍රිය නිශාවේ මෙල්බන් බලාද පිටව යා යුතුය. ඊට පෙර බණ්ඩාර ඇහැලියගොඩ සමග කෝපි එකක් රස බැලීමේ අවස්ථාවක් ලදිමි.

තිරය ඇරෙනවා තිරය වැහෙනවා -
ඔල්වරසන් හඩ පැතිරෙනවා
සඳලුතලෙන් බැස මානවිකාවන් -
තාලෙට ඉඟසුඟ නටවනවා

තිරය ඇරෙනවාල ගීතය ගායනා කරන්න භාර ගන්නා විට සුනිල් එදිරිසිංහයන් ඔහුගේ මිතු-රෙක් නොවන වග දන්නේ බණ්ඩාර මිත්‍ර සමාග මේ ජයලත් මනෝරත්නයන්ය. ඔහු හරහා ඔහු වෙත යවපු ගීත කිහිපයක් අතරින් මෙම ගීතය සහ ලෝකයක් තනන්නට කියන ගීත දෙක ගුවන් විදුලියේ සරළ ගී වැඩසටහන සඳහා සුනිල් තෝරා ගත්තා. උණුසුම් කෝපි කෝප්ප දෙකක් අප ඉදිරියේ. බණ්ඩාරඋන්නැහේ හා හා පුරා කියලා ලියපු පළමුවෙනි ගීතයෙන් ගේය පද කලාවේ තිරය ඇරුනා. ඇහැලිය ගොඩගේ, ඉපදුන ගම පරණගම වුනත්, ලියපු මුල් ගීතය කෙතරම් අලුත් ද නැවුම් ද යන්න, දෙපා සැලෙන මුත් බෙර කවි තාලෙට කරළිය හිමි නැතිව එදා නටපු අපේ ළමයිද අදටද දන්නේ නැත. ඒ කෝඩුකාර කමට මගේ කුඩා මොලේ සැගවී සිටි චුටි මකුළු පැටියා ද මදහසක් පෑවා.

බණ්ඩාරගේ පියා ගොවියෙක්. කොණ්ඩ බැදපු හොද අමුඩ ගහපු ගොයියෙක්. ඇලට දොලට ගහට කොළට සතාසිවුපාවාට ආදරය කරපු, කතා කරපු ගොවි පියෙක්. වත්ත වටපිටේ වැඩ සාමාන්‍ය දෙයක්. පුංචි කාලේ ඉඳල ම ගොවිතැන් වැඩවලට සම්බන්ධ වන්න, ගොයම් කොටන්න, කපන්න, පාගන්න, විතරක් නෙමේ හරක් එළවිලි, දරු නැලවිලි අසන්න පමණක් නොවෙයි බලි තොවිල් බලන්න යැමත් එදිනෙදා ජිවිත පංගුකාරත්වයන් වුනා. ගමේ ඉස්කෝලේ ද ඇහැළියගොඩ ලොකු ඉස්කෝලේද ශාස්ත්‍රෝද්ග්‍රහණ අඩවි බවට පත් වෙනවා. ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලයේන් උසස් පෙළ හදාරන ඔහුට පේරාදෙණිය විශ්ව විද්‍යාල පිවිසුම් වරම් හිමිවෙයි. විශ්ව විද්‍යාල සමගෙ-ය්දි වේදිකාවට පෙම් බැදි බණ්ඩාරගේ ගීත රචනා කිරීමට පෙළඹුනේ තම විවාහයේනුත් පසු කාළයක දී ය. මධු සමයෙන් පසු ගෙදර නෝනට වඩා ලාංකීයත්වය සමග ඔහු බුද්ධිමත් සංවාසයක් ඇති කරගනියි. වයසින් මෝරා-යත්ම ඔහු තව තවත් ගමේ බයියෙක් වෙන්න ආස කරයි. ඒ සුවදට බණ්ඩාර ඉකි බිදින්නේ ගේය පදයෙන්. ආදරේට ආදරෙයි බව ඔහු ඉගි කරයි. ලියවුනු ගීතවල ආදරය අඩංගු සහ වලංගු බව බුද්දක පැටියාගේ නාස් පුඩු වලට දැනෙයි. හැබැයි ඔහු ලියු ආදර ගීත පහකට වඩා වැඩි නැති බව බණ්ඩාර උන්නැහේගේ සුදු කෙස් ගස් පවා හෙටට අත වනයි. කළගෙඩි නැටුමට කළගෙඩි සොළවති නළ වතුරෙන් සැනහෙන දරුවෝ ගොයම් නැටුමකට දෑකැති ලෙළවති කුඹුරක් ඇස නොගැටුන දරුවෝ අපි උදේ හවස කුඹුරු වැඩ කරන අය. ඉස්කොලේ ඇරිලා ගිහින් කුඹුරේ වැඩට උඩවු වෙන දවස් තියෙනවා. ගොයම් කපලා, මඩවලා, හාල් කරන හැටි අපියි දන්නේ. තමන් උදේ හවස ගොවිතැන් වැඩවල නිරත වුණු හැටි ගොයම් කපලා, මඩවලා, හාල් කරන හැටි ඔහුගේ මනසේ අදද ඇදෙයි. ඒත් කොළඹින් ආව අප්සරාවියන් ඒ ගැන දන්නේ මොනවද? ජීවිතේට කුඹුරක් නොදැකපු, මඩක්, කැත්තක් අත නොගාපු ඔවුන් බත කරන හැටි ගැන නැටුම් පෙන්වනවා. ඒත් කුඹුරු කරන හැටි ගැන හොඳින් ම දන්නා, ඒ අත්දැකීම ඇති ගමේ එවුන් වේදිකාව පහළ බලාගෙන ඉන්නවා. කෝපි කෝප්පයේ උගුරක් රහ බලමින් බණ්ඩාර නළල පිරිමදියි. කොළඹ කාන්තා විද්‍යාලයෙන් ආපු බාලිකාවන් බතේ උපත නටපු


Pic by Chandana Wijesinghe

ආකාරය ඔහුගේ නළල් තල ඇතුල් අන්තයේ රග දැක්වෙයි. 70 දශකයේ ලබපු මේ අත්දැකීම තමයි 83 දි ගීතයක් බවට පත්වුනේ. බුද්දක කෙල ගුලියක් උගුරෙන් පහලට යවයි, බණ්ඩාර අස්නයක් සමාජගතකරා යයි බුද්දක පැටියාගේ දකුණු කන් පෙත්තට දැනෙයි.

ගමෙන් ඉපිද පොතපතින් උකහා ගැනීමෙන්, වටපිට අත්දැකීමෙන්, බෙදාහදා ගත් දැනුමෙන් සහ මුහුකුරා ගිය මතියෙන් අනාගත පරම්ප-රාවට ආදර්ශයක් ගෙන එන නූතන ජිවත්වන සමාජයේ විද්වත් සරල සොඳුරු මනුෂ්‍යත්වය දෙස ධර්මසිරි ගමගේ උන්නැහේ සුරලොව සිට අතසතපා බලා හිදින වග කෝපි කෝප්පයට එබෙන සෙවනැල්ලට පෙනෙයි. බණ්ඩාරයන්ගෙ-ග් කවීත්වය යොවුන් පහන් වැට මතින් එලි දැක්වුණු වග නොරහසකි.

මගෙ අමල් බිසෝ දොර හරින්නෙපා - හොඳ පරිස්සමින් ඉඳපන්
මම දීපංකරේ ලතැවුලෙන් මෙසේ - නුඹ මූදුකරේ තනියෙන්

"යොවුන් ප්‍රේමයට වඩා පරිසරය පිළිබඳව, සමාජය පිළිබඳව සහ බණ්ඩාරයන් වෙසෙන වටාපිටාව පිලිබඳව තිබෙන ප්‍රේමය දැඩියි. ඒ නිසා වෙන්නට ඇති ඔහුගේ ගීත අතර ප්‍රේම ගීත අඩු බවක් හැඟෙන්නේ." මෝහයට ප්‍රතිවිරුද්ධ ධර්මය ප්‍රඥාවයි. චිමිනි ලාම්පුවක ආලෝකය තව කෙනෙකුට පෙනෙන්නෙ බැහැරට විහිදෙන එළියෙනුයි. චිමිනිය දැළි බැඳුණාම ඇතුලෙ ආලෝකය කොච්චර තිබුණත් එළිය විහිදෙන්නෙ නෑ. බණ්ඩාර උන්-නැහේගේ පුංචි ඇහැ මා දෙස ලොකුවට බලා හිදී. කෝපි උගුරක් තොල ගෑවෙමි. අපි මොනා හරි කමු ද බුද්දක අසයි.කවියට පෙම් බැදී, හිටවන කවි ගැයූ, විරිදුවෙන් තොරණ් පුබුදුවාලු චරිතයක් එක්ක බීපු කෝපි පොඩ්ඩක්වත් තිත්ත නෑ.

කන්ට බෑ කියා - තනියම එන්ට යයි කියා
ගමටම බත් බුලත් - නිතර දන් දුන්
පියවරුන් වෙතින්..
ජාත වී ඇතත් - පූරුවෙ කරන ලද
පවක් පලදී
බින්න බැස හිදී නගරය අසල දූ පුතුන්..

ලංකා ද්වීපයේ වියලි ලදු කැලෑ ප්‍රදේශ පොදුවේ වන්නිය ලෙස කියයි. බදුර්දීන් නානා වන පෙහෙළියට අත තබද්දී බකන් නිලාගෙන සිටින සුජාත හිටං ලට වඩා බණ්ඩාරඋන්-නැහේ වනපෙත රකිනු වස්, මතක පද උප ශාකලෝකනය කරයි. වනාන්තර පන්තිය, ජනපද ඔස්සේ වෙසතුරු ගුණැතියන් සමග අපව වංකගිරියට රැගෙන යයි. ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය ලග තිබෙන කෝපි කඩේට ගජරා-මෙට ඇද පැළද ගත් අය ගොඩවෙනවා. සහංග සමාජය ගැන ඔහු විපරම් කරන්නේ අනාගත සිදුවීම් දෙසට යටිගිරියෙන් හුවක් තබමින්. මට තාත්තා මතක් වුනා.

වන්නි වන පෙතේ ගම් දනව් පුරා නිවහන
වංක ගිරි වනේ..
වෙසතුරු සදිසි පියවරුන්..
අත් මුදුන් තබා බැතියෙන් වන්දනා කරමි..

වන්නි වන පෙතේ..ගීතය ලිවීමට පාදක වී ඇත්තේ බණ්ඩාරගේ පියාගේ අවමගුලයි. බණ්-ඩාරයන්ගේ පියාගේ අවමගුලට පැමිණි පිරිස්, ඔහුගේ පියා මුලු ගමටම කෑම බීම බෙදා දුන් අයකු බව පවසන ලදී. ඔහුගේ පියා ගොවියකු නිසා එසේ කිරීමට හැකි උවත් ඔහු වැනි රජයෙ-ය් සේවකයකුට කෙසේ නම් ඔහුගේ පියා මෙන් දන් දෙන්න හැකිදැයි සිතට නැගුණු සිතිවිල්ලේ නිර්මාණයයි වන්නි වන පෙතේ.....

බුද්දකට පිංචි ගුණයේ සුළුදිය බරක් දැනෙයි. කවු ද එකෙක් කෝපි කඩේ උඩ තට්ටුවේ ජනේලයක් දඩාස් ගා වසයි. මාසයක් පාසා පඩියක් උදෙසා ජීවිතය හිගා කන දු පුතුන් දෙස සංවේදී ලෙස මෙන්ම ගැඹුරු ලෙස වැසුණු ජනෙල් දොර පලු අතරින් බණ්ඩාර උන්නැහේගේ උපැස් රාජයාට ලෝකය අදද පෙනෙයි.

අන්න බලන් බෙර හඬින් උදම් වී
දෑත දෙපා සෙලැවෙන අන්දම්
අන්න බලන් උඩු ගුවන් තලේ
හිඳ
මාලක්කම කැරකෙන
අන්දම්

බණ්ඩාරගේ පියාගේ සහෝදරයා පාරම්පරික නැටුම් ශිල්පියෙකි. ඔහු නැටුමින් පෙලහර පාන විට එය නැරඹීමට ගම් දනව් ගණනාවක මහා සෙනඟක් රැස්විය. "ගම් පළා-තේ සංදර්ශන, රාත්‍රී තොවිල්, ගම්මඩුවලට ඔහු නැතිවම බැරිවුණා". නමුත් පසු කලෙක, ඔහු පිළිකාවකට ගොදුරු වෙලා මිය යන්නේ කාත් කවුරුත් නැතිව යි. නටන කොට ගමක් එකතු වුනා. පිළිකාව නිසා ගමම ඈත් වුනා. සංවේදී ගේය පද වැලක උපත සිදු වන්නේ එලෙසින්. අපි 1818 කරමු සර්, ඔහු බුද්දකට හිස වනයි.

වර්තමානයේ වගේ නෙවෙයි, බණ්ඩාර උන්-නැහේ ගීත ලිවීම ආරම්භ කළ අවධියේ ලංකා ගුවන්විදුලියේ නිර්ලෝභීව ගීත රචකයාගේ නම ප්‍රකාශ කරනවා. අද සමහර ගුවන් විදුලි, රූපවාහිනී, චිත්‍රපට සහ ප්‍රසංග නිෂ්පාදක වරු යයි කියාගන්නා මණ්ඩල ගීත රචකයන් පමණ-ක් නොව වාදකයින් ද පුරකයන් ද නාමාවලි තුල පෝස්ටර තුල හිරිවට්ටා සමූල ඝාතනයක යෙදෙන්නේ වෘත්තියෙන් බෙලහීන දැනුමේ හසරක් නැති වාණිජ ගණිකාමත්වය පෝෂණය කරන්නට දෝ යැයි මට සිතේ.

තාලයට වඩා රාගය අඩු වැඩි වශයෙන් අමෝරා සමාජ ගතවන යුගයක, ඒ ගින්නෙන් නොපිළිස්සී සිටීමෙ ප්‍රඥාව තියන කෙනා, ගින්නෙන් නොපිළිස්සී ජීවත් වෙන්න-ටත්, එලෙසම ගින්නෙන් ඈත්වෙලා පරිස්සම් වෙන්නටත්, ගින්නට තමන් පිළිස්සෙන හැටි තමන් පිළිස්සෙන පෙර වෙලාවෙදිම සිහියෙන් සහ උපේක්ශාවෙන් දකින්නටත් සමත් විය යුතුය. බණ්ඩාර උන්නැහේ තුල නොපිළිස්සී සිටීමෙ ප්‍රඥාව හොඳින් මට දසුන් වන්නේ වතගොත කලාවට එහා ගිය ගුණ දම් රැදී ගේය පද කලාවෙනි. කෝපි කෝප්පය තාම උණුසුම්.

වර්තමාන ගුවන් විදුලි නාළිකා තුල පෙර යුගයේ මෙන් ගීත උත්පාදක වැඩසටහන් නොමැති වීම විශාල අඩුපාඩුවක් බවත් එය ගීත ක්ෂේත්‍රයේ පරිහානියට හේතු වන බව බුද්දක පැටියාගේ අක්මා බල ප්‍රදේශ වලටද දැනේ. කෝපි සීනි අඩුවෙන් රසයි. නන්දා ද බණ්ඩාර උන්නැහේ සමග පෙර නොවිදි රසයක් ඉතිරි කරයි.

"කීයටද මල්ලි ෆ්ලයිට් එක.?" ඔහු මට මතක් කරයි. අහන්න, ළජීවිතේ කවියක්ල...

පසුපසින් හබා එන අතවර..
හැරදමා..යා නොහැක බෝදුර..
දුක ද ඉවසා දරා ගන්නට
සිතට බල කරනා..
හැඟුම් මව දිව මැවී කවිකම..

ජීවිතේ කවියක්...

බණ්ඩාරගේ ගීත, කනකින් අසා අනික් කනින් පිට කළ හැකි ගීත නොවේ. එදා සමනල්ලු පස්සේ දුවපු විදිය පේර හිබුටු කා මත්වූ දිව රසය, වෙල් ඉස්මත්තේ රංචු ගැහුණු කොක්කු රෑන ද වතු උඩින් පැන පැන ගිහිල්ලා ගස් ගෙඩි කාපු හැටි ද, ඉස්කෝලේ ඇරී ගෙදර එද්දී යට ජංගි කොටේ ද ගලවා වතුරට පැන ජල බුං ගහලා නාපු විදිය ද, බණ්ඩාර උන්නැහේගේ පොඩි කාලේ සුන්දරත්වය මතක ගන්වයි.

මේ බණ්ඩාර උන්නැහේගේම ලොකු කාලය ගැන ය. තම දුවරුන්, පැටවූසේ හිරවෙලා තරිකි මිරිකී වී පාසල් යන ආකාරය දසුන් වෙයි. උදේ 8 ට ඉස්කෝලේ ඉන්න ඕනි පුංචි එවුන් නිදි කඩාගෙන දුක් විදින අයුරු ද පෙනේ. දුකෙන් උපන් නගරේ දරුවන්ගේ දුකේ බරට වඩා කරේ තියා ගෙන පොත් බෑගයේ බර වැඩි යැයි හැගේ. සවස උපකාර පන්ති වන්දනාවේ යන දරු රෑනටද දරුවන් මුර කරන දෙමාපියන්ටද සෙයිලමේ විදින දුක අපමණ බව බුද්දකට හැගේ.

බණ්ඩාරයන්, කණ හරහා ආමන්ත්‍රණය කරන්නේ හදවතටය. මනසට ය. සමාජ ශෝධක ගුණයන්ගෙන් හෙබි ගේය පද කලාවක් ඔහු අත දරා සිටින බව අතිශයෝක්තියක් නොවේ.
අවාසනාවන්ත කාරණය වන්නේ, මෙවැනි ගීත සඳහා වර්තමාන ගුවන් විදුලි නාළිකා වල වෙන් වෙන ඉඩ ප්‍රමාණය, පිදුරංගල පස්සට සුළං වද්දා ගත් සුද්දීගේ පිටපැත්තට, යට ඇති, යටපැත්තේ පසුපසට වඩා අඩු ප්‍රමාණයක් ය. ඒ අපේ නාලිකා ජෝකියන්ගේ ගුණය ය.

දැන් කෝපි කෝප්පය හිස්. දුවලා, මං අසල නැති බව බුද්දකට ද බණ්ඩාරටයන්ට ද එක සේ දැනේ. දුක දිනා ගෙන හැදියන් දුවේ. මං මලක් ලෙස නුඹ නොහැදුවේ ඇයිදැයි කියා නුඹට තේරෙන දවසක් එයි කුසුමේ. මිල මුදල නිල බල යා නොදෙයි, මයේ පුතේ. උබලාට කර ගහන්න දුක උකස් කල නැති පියවරු ජීවත්ව සිටි බව හැගෙයි. කල හොද දේම ඉතිරි වේ. ලෝකයට දෙන්න ආදරය, දිනෙක ලෝකය පෙරලා ආදරය කරයි මගේ දුවේ. දුවේ නුඹ මගෙ...

සැපයයි සිතා හුරුවී හැම දුකකටම
මැසිවිලි නැතුව ජීවත් විය හැමවිටම
දරුවන් වදන්නට හැකිවුණු පළියටම
අම්මා වෙන්න බෑ හැම ගැහැණියකටම

අම්මා වෙන්න බෑ හැම ගැහැණියකටම, බණ්ඩාරයන් කියයි. බුද්දකගේ කුඩා මස්තිෂ්කය රිදුම් දෙයි.

"අපි යං නේද?" ඔහු යෝජනා කරයි. බොදු ගුණ දම් රකින බණ්ඩාරයන්ගේ ආයු වැඩේවා

බණ්ඩාර අයියේ උබ මට දෙයියෙක් බුද්දකගේ යටි සිතේ කවියක් කුරුටු ගායි.
නිතින් සසර දුක ජය ගන්නට පේවී - දහම් සරණ මිස සරණක් නැත දේවී
අම්මා වෙන්න බෑ හැම ගැහැණියකටම...

ඔව්, බණ්ඩාර අයියේ උබ මට දෙයියෙක් කවීත්වයේ දෙයියෙක්

බුද්දක පැටියා කටුනායක බලා පිටත් වුනා, බණ්ඩාර දෙයියා මාලබේ බලා පිටත් වුනා.